සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

නම : ............................................... **ක්‍රිස්තු ධර්මය** කාලය : පැය 02 යි.

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. මෙසේ සඳහන්ව ඇත්තේ
(i) උත්පත්ති පොතෙහි ය. (ii) නික්මයාම පොතෙහි ය.
(iii) ගීතාවලියෙහි ය. (iv) හිතෝපදේශයෙහි ය.

(2) දෙවියන් වහන්සේ පොළොවත් එහි ඇති සියල්ලත් මවා පාලනය කරන බව අප පිළිගන්නේ
(i) බයිබලයේ කියා ඇති නිසා ය. (ii) පාසලේදී ඉගෙන ගත් නිසා ය.
(iii) වැඩිහිටියන් කියන නිසා ය. (iv) අප තුළ ඇති ඇදහිල්ල නිසා ය.

(3) පොරොන්දු දේශය කරා යන ඊශ්‍රායෙල් ජනතාවට , දෙවියන් වහන්සේ දස පණත දෙනු ලැබුවේ,
(i) එම ජනතාව ආරක්ෂා කිරීමට ය.
(ii) යහපත් ජීවිත ගත කිරීමට නිවැරදි මඟ පෙන්වීමට ය.
(iii) දේව ජනතාවක් ලෙස බැඳ තබා ගැනීමට ය.
(iv) දෙවියන් වහන්සේට යටහත් පහත් ලෙස ජීවත් වීමට ය.

(4) දෙවිඳුන්ගේ සිතට එකඟව ජීවත් වූ ඊශ්‍රායෙල් රජකු ලෙස සැලකෙන්නේ,
(i) සාවුල් රජතුමා ය. (ii) සලමොන් රජතුමා ය.
(iii) දාවිත් රජතුමා ය. (iv) ජෙරබෝවම් රජතුමා ය.

(5) දාවිත් රජතුමා විසින් සිදු කරන ලද වරද එතුමන්ට අවබෝධ කරදීමට දෙවියන් වහන්සේ ඔහු වෙතයවනු ලැබුවේ,
(i) එලියා දිවැසිවරයා ය. (ii) නාතාන් දිවැසිවරයා ය.
(iii) එසකියෙල් දිවැසිවරයා ය. (iv) යෙසායා දිවැසිවරයා ය.

(6) ඊශ්‍රායෙල් රජකමට පත්කරනු ලැබූ දාවිත් සිය අගනුවර ලෙස තෝරා ගත්තේ,
(i) බෙත්ලෙහෙමයි. (ii) සමාරියයි. (iii) ජෙරුසලමයි. (iv) ගලීලයයි.

(7) ජේසුස් වහන්සේගේ ප්‍රඥාව ප්‍රකාශ වූ අවස්ථාවක් වන්නේ ,
(i) මුල් ගෝලයින් කැඳ වූ අවස්ථාවයි. (ii) රූප විපර්යාසය අවස්ථාවයි.
(iii) අබ ඇටයේ උපමාව වදාළ අවස්ථාවයි. (iv) පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමට ගෙනා අවස්ථාවයි.

(8) ඒකීය ඊශ්‍රායෙල් රාජ්‍යය සලමොන් රජුගෙන් පසු දෙකඩවීම පිළිබඳව දේව පණිවුඩය ප්‍රකාශ කළේ,
(i) අහියා දිවැසිවරයා ය. (ii) නාතාන් දිවැසිවරයා ය.
(iii) මීකා දිවැසිවරයා ය. (iv) මලාකි දිවැසිවරයා ය.

(9) රෙහෙබෝවම් රජු විසින් යුද්ධයක් මෙහෙයවීම සඳහා ගත් ප්‍රයත්නය වළක්වනු ලැබූ දිවැසිවරයා වන්නේ ,
(i) මලාකි ය. (ii) යෙසායා ය. (iii) ෂෙමායා ය. (iv) මීකාය ය.

(10) ක්‍රිස්තුස් වහන්සේ පිළිගැනීමට ජනතාව සූදානම් කරමින් ස්නාවක ජොහාන් තුමා ඔවුන්ට ආරාධනා කළේ,
(i) මනස්ථාපනය වීමට ය. (ii) ධනය රැස් කිරීමට ය.
(iii) සේවයේ යෙදීමට ය. (iv) දේශනා කිරීමට ය.

(11) ශුද්ධාත්ම මග පෙන්වීම ලත් මුල් කිතුනු සභාව එකිනෙකා සතු සම්පත්
(i) වැඩි කරගත් හ. (ii) පොදුවේ තබාගත් හ.
(iii) ආරක්ෂා කරගත් හ. (iv) විකුණා මුදල් කරගත් හ.

(12) කිතු උපත සිදුවන සමයෙහි යුදා සමාජය පැවතියේ,
(i) ප්‍රීතිදායකව ය. (ii) මලානිකව ය.
(iii) සමෘද්ධිමත්ව ය. (iv) අන්ධකාරයේ ය.

(13) ජේසුස් වහන්සේගේ සුවය ලැබූ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් නැවත උන්වහන්සේ වෙත පැමිණි තැනැත්තා
(i) ජුදා ජාතිකයෙකි. (ii) ඉතියෝපිය ජාතිකයෙකි.
(iii) රෝම ජාතිකයෙකි. (iv) සමාරිය ජාතිකයෙකි.

(14) ජේසුස් වහන්සේ තුළින් සිය ආධ්‍යාත්මික අන්ධභාවය දුරුකරගත් දෙදෙනෙකු වන්නේ,
(i) සීමොන් හා මරියා ය. (ii) සාකෙවුස් හා සමාරිය ස්ත්‍රිය ය.
(iii) නිකදේමුස් හා මරියා ය. (iv) ජෝහන් සහ සමාරිය ස්ත්‍රිය ය.

(15) ජේසුස් වහන්සේ සමග කන්දට නැගුණු ශ්‍රාවකයින් තිදෙනා නම්,
(i) පේදුරු,ජෝහාන් හා ජාකොබ් ය. (ii) පේදුරු, ජාකොබ් හා ඇන්ඩෲ ය.
(iii) පේදුරු, ජොහාන් හා ඇන්ඩෲ ය. (iv) ජොහාන්, ජාකොබ් හා ඇන්ඩෲ ය.

(16) ජේසුස් වහන්සේව දකින්නට අත්තික්කා ගසට නැගසිටි තැනැත්තා
(i) එඬේරෙකි. (ii) ධීවරයෙකි. (iii) අයකැමියෙකි. (iv) ගොවියෙකි.

(17) කල්කටාවේ මුඩුක්කුවල ජීවත් වූ ජනතාව වෙනුවෙන් තම ජීවිතය කැප කළ උදාර කාන්තාව වන්නේ,
(i) තෙරේසා මව්තුමියයි. (ii) ඉව්ලින් කානි තුමියයි.
(iii) ෆ්ලෝරන්ස් නයිටින්ගේල් තුමියයි. (iv) එලිසබෙත් බේකර් තුමියයි.

(18) මාටිං ලූතර් කිං පූජකතුමා අවිහිංසාවාදී නායකත්වය ලබා දුන්නේ,
(i) දේශපාලන පීඩාවන් පිටු දැකීමට ය. (ii) වර්ණභේද වාදය පිටු දැකීමට ය.
(iii) ළමා හිංසනය පිටු දැකීමට ය. (iv) කාන්තා හිංසනය පිටු දැකීමට ය.

(19) පේදුරුතුමාගේ ප්‍රථම දේශනයෙන් කිතුනු සභාවට එක් වූ සංඛ්‍යාව
(i) 1000 කි. (ii) 2000 කි (iii) 3000 කි. (iv) 5000 කි.

(20) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින්ට මිහිපිට දිව්‍ය මෙහෙවර භාර කරමින් ප්‍රකාශ කළේ,
(i) 'කිතුණු සභාව වර්ධනය කරන්න' යනුවෙනි.
(ii) 'මිනිසුන් දිනන්නන් වන්න' යනුවෙනි.
(iii) 'දේව රාජ්‍යය ප්‍රකාශ කරන්නන් වන්න' යනුවෙනි.
(iv) 'පොළොවේ සීමාන්ත දක්වා මාගේ සාක්ෂිකාරයෝ වන්න' යනුවෙනි.

( ලකුණු 2 x 20 = 40 )

# II කොටස

V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) බයිබලයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කතන්දර දෙකක් සඳහන් කරන්න.
(ii) වැරදි මඟ ගිය ජනතාව නිවැරදි මඟට ගැනිමට දෙවියන් වහන්සේ කැඳවූයේ කවුරුන් ද?ඔවුන්ට භාරවූ කාර්ය කුමක් ද?
(iii) සාමුවෙල් පූජකතුමා වෙත පැමිණි ඉශ්‍රායෙල් ජනතාව කළ ඉල්ලිම කුමක් ද?
(iv) ''මා ඔබට දිය යුතු දේ ඉල්ලන්න'' මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කරන ලද්දක් ද?
(v) ඉශ්‍රායෙල් වරුන් වාර්ෂිකව පැවැත් වූ මංගල්‍ය දෙකක් නම් කරන්න.
(vi) ජේසු උපත සමයේ ජුදා සමාජයේ පීඩාවට ලක් වූ ජන කොට්ඨාස දෙකක් නම් කරන්න.
(vii) ජේසුස් වහන්සේගේ ආලෝකය ලබා ජීවිතය වෙනස්කර ගත් මෑත කාලීන දෙදෙනෙකු නම් කරන්න.
(viii) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් ශුද්ධාත්ම දානය ලැබුවේ කවදා ද?

( ලකුණු 2 x 8 = 16 )

(2) (i) සාවුල් රජතුමා දාවිත් පසු පස එළවා ඔහු මැරීමට උත්සහ කළේ ඇයි?
(ii) තමා මැරිමට උත්සහ කරන සාවුල් රජතුමා තම අතටම අසුවූ අවස්ථාවේ දාවිත් ක්‍රියා කල අයුරු සදහන් කරන්න.
(iii) ඔබට විරුද්ධකම් කරන සතුරකුගෙන් පළිගැනීමට ඔබට අවස්ථාවක් උදා වුවහොත් කිතුනුවකු ලෙස ඔබ ක්‍රියා කරන අයුරු වාක්‍ය පහකින් විස්තර කරන්න.

( ලකුණු 2+ 3+6 = 11 )

(3) (i) සලමොන් රජුගෙන් පසු සිහසුන හිමිවූයේ කාහට ද?
(ii) ඉශ්‍රායෙල් නායකයෝ සිහසුන දීමට පෙර ඔහුගෙන් කළ ඉල්ලීම හා පොරොන්දු ලියා දක්වන්න.
(iii) යහපත් රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය කරුණු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 2+ 3+6 = 11 )

(4) (i) නවීන තාක්ෂණයේ විශ්මිත නිර්මාණයන් දෙකක් නම් කරන්න.
(ii) නවීන තාක්ෂණය අයුතු ලෙස භාවිතා කරන අවස්ථා තුනක් සඳහන් කරන්න.
(iii) නවීන තාක්ෂණය යහපත් ලෙස භාවිතා කළ හැකි අවස්ථා තුනක් හා ඉන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න.

(5) (i) රූප විපර්යාසය අවස්ථාවේ ජේසුස් වහන්සේ දෙපසින් සිටිනවා ශ්‍රාවකයින් දුටුවේ කවුරුන් ද?
(ii) ඔවුන් මගින් සංකේතවත් කරන්නේ කුමක් ද?
(iii) මෙම අවස්ථාවේ ශ්‍රාවකයින්ට ඇසුණු හඬත් ඔවුන් දුටු දේත් ලියා දක්වන්න.

( ලකුණු 2+ 3+6 = 11 )

(6) (i) මුල් කිතුනු සභාවේ ප්‍රථම ප්‍රාතිහාර්ය කුමක් ද?
(ii) එය සිදුකල ශ්‍රාවකයින් ගණන කීයද? ඔවුන් කවුද?
(iii) ඔවුන් මුහුණදුන් අභියෝග කෙටියෙන් පැහැදිලි කරන්න

( ලකුණු 2+ 3+6 = 11 )

(7) (i) දේව රාජ්‍යය පදනම කුමක්ද?
(ii) දේව රාජ්‍යය වෙනුවෙන් මෑත කාලයේදී තම ජීවිතය පවා කැප කලා වූ අයවලුන් දෙදෙනෙකු නම් කරන්න.
(iii) දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා කිතුනු දරුවෙකු ලෙස ඔබ ක්‍රියා කරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 2+ 3+6 = 11 )

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

## ක්‍රිස්තු ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 1 | (6) | 3 | (11) | 2 | (16) | 3 |
| (2) | 4 | (7) | 4 | (12) | 4 | (17) | 1 |
| (3) | 2 | (8) | 1 | (13) | 4 | (18) | 2 |
| (4) | 3 | (9) | 3 | (14) | 2 | (19) | 3 |
| (5) | 2 | (10) | 1 | (15) | 1 | (20) | 4 |

## II කොටස

(1) i විශ්වය මැවීම,ආදම් සහ ඒව ,කායින් සහ ආබෙල්, නොවාගේ ජල ගැල්ම, බාබෙල් කොත
ii. දිවැසිවරුන් , දේව පණිවුඩය ජනතාව වෙත ප්‍රකාශ කිරීම.
iii. අපව පාලනය කරන පිණිස අපටත් රජෙක් පත් කළ මැනව.
iv. දෙවියන් වහන්සේ විසින් සලමොන් රජුට කරන ලදී.
v. පාස්කු මංගල්‍යය, පෙන්තකෝස්ත මංගල්‍යය, කූඩාරම් මංගල්‍යය
vi. දුගීන් , රෝගීන් , අයකැමියන් කාන්තාවන් දරුවන් වැනි අය
vii. චාල්ස් නෙල්සන්, ජොන් නිව්ටන් , ෂෙලි බවුන්
viii. පෙන්තකොස්ත මංගල්‍යය දිනයේදී

(2) i. ගොලියත් මැරීම නිසා ජනතා ප්‍රසාදය දාවිත්ට හිමි වීම. සාවුල් රජුට දරාගැනීමට නොහැකි වීම.
ii. මාගේ ස්වාමියා මාගේ සමිඳාණන්ගේ අභිෂේක ලත් තැනැත්තාට විරුද්ධව මාගේ දෑත ඔසවන්නේ නැත. මම ඔබට දුෂ්ටකම් නොකරයි.
iii. තමාට කොතරම් සතුරුකම් කලත් ඔහුට විරුද්ධව කිසිවක් නොකර ඔහුට සමාව දීමට ක්‍රියාකරන අයුරු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

(3) i සලමොන්ගේ පුත් රෙහෙබෝවම්ටය
ii. ඔබේ පියා අපේ කරමත තැබූ බර සැහැල්ලු කරන්න. එවිට අපි ඔබට සේවය කරන්නෙමු.
iii. යහපත් නායකයෙකු සිටිම, නිවැරදි මග පෙන්වීම, ඵලදායි අවවාද හා උපදෙස් වැනි කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.

(4) i. පරිගණකය, රොබෝ චන්ද්‍රිකා, ජංගම දුරකථන වැනි නවීන උපකරණ
ii. පරිගණකය , ජංගම දුරකථනය, අන්තර්ජාලය , යුධ උපකරණ වැනිදේ අයුතු ලෙස භාවිතා වන අවස්ථා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. ජංගම දුරකථනය, පරිගණකය, අන්තර්ජාලය.
සන්නිවේදන පහසුකම් සැලසීම.
තොරතුරු රැස් කිරීම හා ගබඩා කිරීම.
විවිධ කරුණු රැස් කිරීම, චන්ද්‍රිකා, අභ්‍යවකාශ මධ්‍යස්ථාන, තොරතුරු ලබා ගැනීම වැනි කරුණු

(5) i. මෝසෙස් සහ එලියා
ii. මෝසෙස් ව්‍යවස්ථාවලියත් එලියා දිවැසිවලියත් සංකේතවත් කරයි.
iii. "මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය.මා තෝරා ගත් තැනැත්තේය.මොහුට සවන්දෙන්න".
වලාකුළකින් ප්‍රදේශය වැසී යාම,ජේසුස් වහන්සේගේ ස්වරූපය වෙනස් වීම, මෝසෙස් හා එලියා දෙපසින් දර්ශනය වීම.

(6) i. උපතේ පටන් කොර වූ මනුෂ්‍යයෙකු සුව කිරීම
ii. 02 පේදුරු ජොහාන්
iii. ඔවුන් අත්අඩංගුවට ගැනිම.ඔවුන් මේ දේවල් කරන්නේ කුමන බලයකින්ද ,කාගේ නාමයෙන් දැයි ප්‍රශ්න කිරීම, පේදුරු තුමා ජේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂි දැරීම ලියා තිබීම.

(7) i. දේව ප්‍රේමය මත පදනම් වූ ධර්මිෂ්ටකම යුක්තිය හා සාධාරණත්වය
ii. අසීසියේ ෆැන්සිස් තුමා , ඉව්ලින් කානි තුමිය, ඩෙස්මන් ටුටු අගරදගුරුතුමා,මයිකල් රොද්‍රිගු පියතුමා යන අයගෙන් තිදෙනෙකු
iii. සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.